## කතෝලික චින්තනයේ දුබල අභියෝග

බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් සිංහල බෞද්ධ චින්තනය පරදවනු ලැබීය යන්නෙන් අදහස් කෙරෙන්නේ සිංහල බෞද්ධ චින්තනය නෛසර්ගික ව ගත්කල දුර්වලවීම හෝ වෙනත් එවැනි හේතුවක් නිසා හෝ පරාජය වූ බව නො වේ. බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය සිංහල බෞද්ධ චින්තනයට වඩා ශක්තිමත් එසේත් නැත්නම් යහපත් නිසා එලෙස පරාජය විණි යන්නක් ද මෙහි දී අදහස් නො කෙරෙයි. ඉන් කියැවෙන්නේ එදා පැවති සමාජයට සිංහල බෞද්ධ චින්තනයට ඔරොත්තු නොදිය හැකි වූ බව ය.

ලංකාවේ අද පවතින ක්‍රිස්තියානි සමාජය අවුරුදු පන්සියයක් මුළුල්ලේ විකාශය වූවකි. පෘතුගීසීන් මෙරටට පැමිණි දිනයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මෙරටට හඳුන්වා දෙනු ලැබිණි. එකල පෘතුගීසීහු ආගමින් කතෝලික වූහ. එහෙත් ඔවුන්ගේ චින්තනය ග්‍රික යුදෙව් ක්‍රිස්තියානි බවට පත්වෙමින් තිබිණි. රෙපරමාදු ක්‍රිස්තියානිය ද එකල යුරෝපයේ නොතිබිණි. රෙපරමාදු ක්‍රිස්තියානිය නිල වශයෙන් හඳුන්වාදෙනු ලැබුයේ 1517 දී ය. එහෙත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඒ වන විටත් දකුණු යුරෝපයේ ක්‍රමයෙන් වැඩෙමින් තිබිණි. රෙපරමාදු හා විවිධ ක්‍රිස්තියානි ආගම් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ ආගමික මුහුණුවර විය.

එකල යුරෝපයේ තිබියේ කතෝලික චින්තනය ය. කතෝලික චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පරාජය විය. අප කලින් සඳහන් කර ඇති ආකාරයට චින්තනය හා සමාජය අතර ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. පහළොස්වැනි සියවසේ දී දකුණු යුරෝපය වෙනස්වීමට පටන්ගත්තේ ය. පළමුවෙන් ම ඒ වෙනස ඇතිවූයේ කලාකරුවන් අතර ය. විශේෂයෙන් ම චිත්‍රශිල්පීහු ප්‍රතිමා නෙළන්නෝ එහි නායකත්වය ගත්හ. වෙන්කිරීම, පුද්ගලිකත්වය ඉස්මතුකිරීම පළමුවෙන් ම කළෝ ඒ කලාකරුවෝ ය. අද පුනරුදය නමින් හැඳින්වෙන්නේ ඉතාලියෙහි සිදු වූ මේ කලා පෙරළිය යි. එය යුරෝපීයයන් සලකන්නේ යළි පිබිදීමක් ඉපදීමක් ලෙස ය.

එසේ වුවත් ඒ කලා පෙරළියක් පමණක් නොව චින්තන විප්ලවයක් ද විය. කලාකරුවන්, එනම් චිත්‍ර ශිල්පීන් හා මූර්ති ශිල්පීන් අතින් හඳුන්වා දෙනු ලැබූ නව කලා ආකල්ප, ප්‍රමිතීන් ආදිය පිළිගැනීමට උගත් සමාජය සූදානම් ව සිටියේ ය. පාප් වහන්සේගේ ආධිපත්‍යයට එරෙහිව සටන් කළ යුතු බවට ඉතාලියේ කෙසේ වෙතත් ඇතැම් යුරෝපීය රටවල මතයක් පැතිර යමින් පැවතියේ ය. මේ අතර අරාබි වෙළෙන්දන් ඔස්සේ පෙරදිගින් පැමිණි දැනුම ද නැගෙනහිර හා දකුණු යුරෝපීයයන් අතර ප්‍රචලිත විය. වෙනත් චින්තනයක නිර්මාණය වූ ඒ දැනුම අවශෝෂණය කරගැනීම සංයුක්ත චින්තනයක් වූ කතෝලික චින්තනයට ප්‍රශ්නයක් විය.

බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඇතිවූයේ එවැනි පසුබිමක ය. එහි ග්‍රීක චින්තනයෙන් මෙන් ම යුදෙව් චින්තනයෙන් ද ගත් කොටස් විය. එයට අමතරව ක්‍රිස්තියානි චින්තනයක් ද විය. ඒ අප විසින් ක්‍රිස්තියානි චින්තනය යැයි නම් කෙරුණ ද ක්‍රිස්තියානි ආගම පහළ වූයේ චින්තනය ඇතිවී කලකට පසුව ය. අප විසින් කලකට පෙර පෙන්වා දෙනු ලැබ ඇති පරිදි බොහෝ විට ආගමක් පහළ වනුයේ යම් චින්තනයක ය. ආගම විසින් පසුව චින්තනය ද යම් ප්‍රමාණයකට වෙනස් කෙරෙයි. මේ සියල්ල ප්‍රවාහයක් මිස ස්ථිතික ප්‍රපංචයක් නො වේ. අප ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ක්‍රිස්තියානි නමින් ද හඳුන්වන්නේ ඒ චින්තනය හා පසුව ඇතිවූ ආගම අතර ඇති සම්බන්ධය සලකමිනි.

ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් කතෝලික චින්තනය පරාජය කෙරිණි. ඉන් අදහස් වන්නේ කතෝලික චින්තනය මියගිය බව නො වේ. කතෝලික චින්තනය අදත් ලෝකය පුරා හොල්මන් කරයි. මා මෙහි දී සලකන්නේ කතෝලික චින්තනය මිස කතෝලික ආගම නො වේ. මාක්ස්වාදය මෙන් ම ෆැසිස්ට්වාදය ද කතෝලික චින්තනය මත පදනම් වෙයි. කතෝලික චින්තනය නැවත වරක් යුරෝපයේ හිස එසවීමට තැත්කෙළේ එසේත් නැත්නම් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පරාජය කිරීමට උත්සාහ කෙළේ ෆැසිස්ට්වාදය හා මාක්ස්වාදය ඔස්සේ ය. කතෝලික චින්තනයේ අවාසනාවකට මේ මතවාද දෙක එකිනෙක සමග ඇතැම් කරුණු අතින් ප්‍රතිරෝධ ඇතිකර ගත්තේ ය. එහි ප්‍රතිඵලය වූයේ ෆැසිස්ට්වාදය හා මාක්ස්වාදය එකිනෙකට සතුරු වීම ය.

© Prof. Nalin De Silva

මෙයින් කියැවෙන්නේ ෆැසිස්ට්වාදය හා මාක්ස්වාදය එකිනෙකට සතුරු නොවන්නට කතෝලික චින්තනයට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පරාජයකිරීමට හැකියාවක් තිබූ බව නො වේ. ඒ වන විට සමාජය විකාශය වී තිබුණේ පෞද්ගලිකත්වය ඉස්මතු කරමින් සාමූහිකත්වය යටකරමින් ඉන්ද්‍රිය පිනවීමටත් ඒ සඳහා පරිභෝජනය වැඩිකිරීමටත් ය. එයට අමතරව විශ්ලේෂණයට දුන් ප්‍රමුඛත්වය ආදිය ද විය. පරිභෝජනය වැඩිකිරීම සඳහා නිෂ්පාදනය වැඩිකිරීමේ අවශ්‍යතාව විය. එහෙත් සාමූහිකත්වය මත පදනම් වී නිෂ්පාදනය වැඩිකිරීමේදී පෞද්ගලිකත්වය මත පදනම් වී නිෂ්පාදනය වැඩිකිරීමේදීට වඩා ප්‍රශ්න ඇතිවේ. ෆැසිස්ට්වාදය සාමූහිකත්වය ඇතිකෙළේ ඒකාධිපතියකුගේ ආධිපත්‍යයට මුළු සමාජය ම යටකරමිනි. මාක්ස්වාදය ඒ කෙළේ පක්ෂ නායකත්වයකට, එහි දී ද අවසාන වශයෙන් ගත්කල පුද්ගලයකුගේ ආධිපත්‍යයකට, සමාජය යටකරමිනි.

එහෙත් ඒ එකක්වත් දීර්ඝකාලීන ව කළහැකි දේ නො වේ. එයට හේතුව එකල තිබූ සමාජයෙහි කතෝලික චින්තනය යල්පැනගිය වලංගු නොවූ චින්තනයක් වූ බැවිනි. සමාජයකට චින්තනයක් බලහත්කාරයෙන් පැටවිය හැකි නො වේ. චින්තනයක් විසින් සමාජය වෙනස්කරනු ලැබේ. එහෙත් එසේ කළහැකි වන්නේ සමාජය ඒ සඳහා සූදානම් ව ඇත්නම් පමණකි. ෆැසිස්ට්වාදය හා මාක්ස්වාදය අතර ප්‍රශ්න නොතිබුණත් ඒ දෙක ම යථාකාලයේ දී නැතිවීමට තිබුණි. ෆැසිස්ට්වාදය පරාජයවීමෙන් පසුව ලෝකයේ මාක්ස්වාදය ඉතිරිවුවත් එයට ඉන්පසු ෆැසිස්ට්වාදයෙන් තර්ජනයක් නොතිබුණත් මාක්ස්වාදී රාජ්‍යය ද අවසානයේ දී අවුරුදු හැත්තෑවක් වැනි සුළු ආයුකාලයක් පමණක් වළඳා අභාවයට ගියේ ය. මානව ඉතිහාසයේ අවුරුදු හැත්තෑවක් යනු ඉතාමත් සුළු කාල පරිච්ඡේදයක් බව අමුතුවෙන් කිවයුතු නො වේ.

එහෙත් කලින් සඳහන් කළ පරිදි අදත් කතෝලික චින්තනය ලොවේ හොල්මන් කරයි. ඒ චින්තනය විසින් මෙහෙයවනු ලබන්නෝ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වූ බටහිර විද්‍යාවට ඉඳහිට අභියෝග කරති, කතෝලික චින්තනය මත පදනම් වූ මාක්ස්වාදී විකටරූප තවමත් දකුණු ඇමෙරිකාවේ කාලයෙන් කාලයට පහළවනු දැකිය හැකි ය. දකුණු අමෙරිකාව සමස්තයක් ලෙස ගත්කල කතෝලික මහාද්වීපයකි. ආගමින් කතෝලික වූ ඒ මහාද්වීපයෙහි ඉඳහිට ඇතැම් රටක කතෝලික චින්තනය හා මාක්ස්වාදී විකට රූප මතුවෙනු දක්නට හැකි ය. අද දකුණු ඇමරිකාවේ මතු වී ඇති මාක්ස්වාදී විකටරූපවලට වැඩි ආයුෂක් නැත. ඇමරිකා එක්සත් ජනපදයෙහි ආර්ථිකය නැවත වරක් ධන වටයකට යත් ම මේ විකටරූප ඉතිහාසයේ වේදිකාවෙන් කිසිම හැලහොල්මනක් නැතිව ම බැසයනු ඇත.

මෙයින් අදහස් කෙරෙන්නේ දකුණු ඇමරිකාවේ විවිධාකාර ඊනියා සමාජවාදී ආණ්ඩු ඉක්මණින් ම නැතිවී යන බව නො වේ. ඒ සමාජ ටික කලක් තිබී පසුව ඇමරිකාවේ සෘජු හෝ වක්‍ර හෝ බලපෑමෙන් නැති වී යයි. ඇමරිකාවේ බලපෑම යනු අන්කිසිවක් නොව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි බලපෑම ය. නැවතත් කල්ගත වීමෙන් පසුව දකුණු ඇමරිකාවේ ඒ රටේම හෝ වෙනත් රටක හෝ මාක්ස්වාදී විකට රූපයක් මතුවෙයි. එය චක්‍රයක ගමන් කරයි. එදා අයියන්ඩේ (ඇලන්ඩේ) විය. අද චාවේස් හා ලූලා ඩා සිල්වා වැන්නෝ වෙති. එහෙත් ඒ රාජ්‍ය පුද්ගලබද්ධ වෙයි. ඒ ඒ පුද්ගලයා නැතිවීමෙන් පසු ඊනියා සමාජවාදය ද නැතිවී යයි.

දකුණු ඇමරිකාවේ රටවල ලිබරේෂන් තියොලොජි නමින් හැඳින්වෙන විමුක්තිකාමී දේවධර්මයක් ද ඇති බව මෙහි දී අවධාරණය කළ යුතු ය. කතෝලික පූජකවරුන් අතර පැනනැගී ඇති මේ ව්‍යාපාරය සමාජයට විමුක්තිය උදාකිරීමේ චේතනාවෙන් ක්‍රියාකරනු දැකිය හැකි ය. එය සම්මත කතෝලික පල්ලියෙන් කැඩීමට අදහස් නොකරයි. ඒ වෙනුවට කතෝලික පල්ලිය තුළම යම් ප්‍රතිසංස්කරණ කිරීම එහි අරමුණ වෙයි. මේ ව්‍යාපාරය දහසයවැනි සියවසේ ඇතිවූ මාටින් ලූතර් නම් පූජකවරයාගේ ගේ ව්‍යාපාරයට වඩා වෙනස් වෙයි. මාටින් ලූතර් නැගී එමින් පැවති ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පිළිගත්තෙකි. ඔහුට අවශ්‍ය වූයේ මුළුමනින් ම කතෝලික චින්තනයෙන් හා කතෝලික ආගමෙන් කැඩී වෙන්වී වෙන ම ආගමක් ඇති කිරීම ය.

එහෙත් දකුණු ඇමරිකාවේ කතෝලික පූජකවරුන්ට කතෝලික පල්ලියෙන් හෝ කතෝලික චින්තනයෙන් හෝ කැඩීමේ අවශ්‍යතාවක් නැත. ඔවුන් දකින ආකාරයට ද සමාජයේ විෂමතා ඇති අතර සූරාකෑමකට ලක්වන්නෝ වෙති. මේ ප්‍රජකවරු ධනපති ක්‍රමයට විරුද්ධ වෙති. ඒ ඔස්සේ ඔවුහු යම් ප්‍රමාණයකට ධනපති ක්‍රමය පදනම් වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට විරුද්ධ වෙති.

© Prof. Nalin De Silva

එහෙත් ඔවුන්ට විකල්පය ඇත්තේ සිංහල බෞද්ධ චින්තනයක නොව නැවතත් කතෝලික චින්තනයෙහි ම ය. කතෝලික පූජකවරුන් ලෙස ඔවුහු තම චින්තනය මත පදනම් වූ මාක්ස්වාදී සමාජවාදයෙහි සමාජ අසාධාරණයට පිළියම් දකිති. ඔවුහු කතෝලික පල්ලියෙහි සුළු සුළු වෙනස්කිරීම් ඔස්සේ විමුක්තිය ලබාගත හැකි යැයි විශ්වාස කරති. එසේ කිරීමට ඔවුන්ට හැකි වී ඇත්තේ මාක්ස්වාදය බොහෝ දෙනා නොදකිතත් කතෝලික චින්තනය මත පදනම් වී ඇති බැවිනි. විමුක්තිකාමී දේවධර්මවාදය යනු අන්කිසිවක් නොව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පරදවා ඒ මත බිහිවී ඇති ධනපති සමාජය වෙනස්කර නැවතත් කතෝලික චින්තනය ජයග්‍රහණය කරවීමට දරණ උත්සාහයක් පමණකි. මේ පූජකවරුන්ට ද අවශ්‍ය වනුයේ ධනපති සමාජය වෙනුවට කතෝලික චින්තනය මත පදනම් වී යම් ආකාරයක මාක්ස්වාදී සමාජවාදයක් ඇතිකිරීම ය. මේ රටවලින් චාවේස් වැන්නවුන් බිහිවීම අපේක්ෂා කළ යුතු ය.

විමුක්තිවාදී දේවධර්මය යම් ප්‍රමාණයකට දැකිය හැකි එකම ආසියාතික රට පිලිපීනය ය. කතෝලික රටක් වූ පිලිපීනයෙහි ඒ දේවධර්මය ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නා පූජකවරු වෙති. එහෙත් පිලිපීනයට තවමත් තාවකාලිකව වුව ද චාවේස් කෙනකු බිහිකර ගැනීමට හැකි වී නැත. එයට හේතුව පිලිපීනය ඇමරිකා එක්සත් ජනපදයේ අතිමහත් බලපෑමට හසුවී තිබීම ය. කතෝලික චින්තනය පිලිපීනයේ දී ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හමුවෙහි තීරණාත්මක ලෙස පසුබා ඇත. පිලිපීනය ආගමින් කතෝලික වුව ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය රජයන රටකි. එය දකුණු ඇමරිකාවේ කතෝලික රටවලින් වෙනස් වෙයි. දකුණු ඇමරිකාවේ ඉදිහිට වුවත් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තාවකාලික ව වුව ද පසුබැස්සවීමේ හැකියාව වෙයි. එහි කතෝලික චින්තනයට උරදෙන ප්‍රබල ජාතිකත්වයක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva